2659

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2018
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade : 06 | විෂයය / பாடம் / Subject : ඉස්ලාම් | පත්‍රය / வினாத்தாள் / Paper : I ,II | කාලය / காலம் / Time : පැය 02 යි. |

නම:- ............................................................ විභාග අංකයː- ............................................

- වඩාත් සුදුසු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

## I කොටස

01. "ආමන්තුබිල්ලාහ්" යනු
    1. මලාඉකාවරු විශ්වාස කිරීම
    2. ආගම විශ්වාස කිරීම
    3. අල්ලාහ් විශ්වාස කිරීම
    4. නබිවරු විශ්වාස කිරීම

02. පරලොව විශ්වාසය, යන වචනය භාවිතාවන කොටසකි.
    1. තව්හීද්
    2. රිසාලත්
    3. මහාද්
    4. බඃස්

03. තැඹිලි වතුර අයත් ජල වර්ගය,
    1. මාඋඃන් තාහිර්
    2. මාඋඃන් තාහූර්
    3. මාඋඃන් නජිස්
    4. මාඋඃන් ජාඉස්

04. ෆාතිමා (රළි) තුමිය වෆාත් වන විට එතුමියගේ වයස,
    1. 40යි
    2. 28යි
    3. 35යි
    4. 25යි

05. ආයිෂා (රළි) තුමියගේ පියා,
    1. උස්මාන් (රළි)
    2. අලි (රළි)
    3. අබූබක්කර් (රළි)
    4. සාඉද් (රළි)

06. මුහම්මද් නබි (සල්) තුමාට වහි ගෙනා මලාඉකාවරයා,
    1. ජිබ්රීල් (අලෛ)
    2. මීකාඉල් (අලෛ)
    3. රිල්වාන් (අලෛ)
    4. මාලික් (අලෛ)

07. සලාතයේ ෂර්ත්වලින් එකකි,
    1. සූරා ෆාතිහා පාරායනා කිරීම
    2. අව්රතය ආවරණය කර තිබීම
    3. ඉඃතිදාලයට පැමිණීම
    4. පළමුවන සලාමය පැවසීම

08. අල් කුර්ආනයේ කෙටිම සූරාව
    1. නාස්
    2. කව්සර්
    3. ෆලක්
    4. නස්ර්

09. වුළුහි සුන්නතයකි,
    1. මුහුණ සේදීම
    2. මිස්වාක් කිරීම
    3. හිස මස්හු කිරීම
    4. අනුපිළිවෙලට ඉටු කිරීම

10. හදීස් යනු නබි (සල්) තුමාගේ,
1. වදන්
2. අනුමැති
3. ක්‍රියා
4. වදන්, අනුමැති, ක්‍රියා තුනම වේ.

11. අල් කුර්ආනය සම්පූර්ණයෙන්ම පහළ වීමට ගත වූ කාලය,
1. අවු. 13
2. අවු. 23
3. අවු. 63
4. අවු. 40

12. නබි සල් තුමාණන් පරලොවට මිහ්රාජ් ගමන ගිය අවස්ථාවේ නිරයේ සිටි පිරිසක් දුටුහ. ඔවුන් මිනී මස් කමින් තඹවලින් යුත් තම නියවලින් තම මුහුණ හා පපුව සූරමින්, තුවාල කර ගනිමින් පසු වූහ. ඔවුන් කළ පාපය වනුයේ,
1. බොරු කීම
2. බොරු පොරොන්දු දීම
3. කේලම් කීම
4. සොරකම් කිරීම

13. තම දෙමව්පියන් තෘප්තිමත් කළ පුද්ගලයා, කවරෙකු තෘප්තිමත් කරයි ද?
1. නබි (සල්) තුමාව
2. මිනිසුන් ව
3. මලාඉකාවරුව
4. අල්ලාහ් තආලාව

14. අල් කුර්ආනයේ 113 වන සූරාව,
1. අහද්
2. නාස්
3. කාෆිරූන්
4. ෆලක්

15. ගින්න භාවිතා කර කිසිදු ජීවිතයක් දවා වේදනා නොකරන ලෙස පැවසුවේ,
1. නබි (සල්) තුමා
2. අබූබක්කර් (රළි)
3. අල්ලාහ්තආලා
4. ඉබ්රාහීම් (අලෛ)

16. වුළුහි ෆර්ල්,
1. හයයි
2. හතරයි
3. පහයි
4. දහයයි

17. මව්කිරි පමණක් බොන වයස අවු. 2කට අඩු පිරිමි දරුවකුගේ මුත්‍රා
1. පහසු නජිස්
2. සාමාන්‍ය නජිස්
3. දැඩි නජිස්
4. නජිස් නොවේ

18. සකාතය ඉස්ලාමයේ කීවෙනි වගකීමද?
1. පළමුවන
2. තුන්වන
3. පස්වන
4. දෙවන

19. ස්වර්ගය, කුලිය වශයෙන් ලැබෙන ඉබාදතයකි,
1. සලාතය
2. උපවාසය
3. සකාත්
4. හජ්

20. නබි වරුන්ගෙන් පැවත එන්නන් ලෙස හඳුන්වන්නේ,
1. විද්වතුන්
2. රජවරුන්
3. රෝගීන්
4. නූගතුන්

(ලකුණු 40)

## II වන කොටස

**ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

01. (i) සූරා අන් නාස් හි වාක්‍ය කීයක් අඩංගු ද? (ලකුණු 2)
    (ii) අහද් සූරාව හඳුන්වන වෙනත් නම් දෙකක් ලියන්න. (ලකුණු 4).
    (iii) කෑබාව, අල්ලාහ් ඇත් හමුදාවෙන් ආරක්ෂා කළ අයුරු කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 6)

02. (i) අල්ලාහ්ගේ මැවුම්වලට අප විසින් කළ යුතු යුතුකම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)
    (ii) අල්ලාහ් කඳු මැවීමට හේතු වූ කාරණාව කුමක් ද? (ලකුණු 4)
    (iii) පරිසරය සුරකීම සඳහා අප අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ග කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 6)

03. (i) ඉබ්ලීස් ආදම් (අලෛ) තුමාට සුජූද් කිරීමට ප්‍රතික්ෂේප කළේ ඇයි? (ලකුණු 2)
    (ii) අසල්වැසි වර්ග තුනක් ඇත. ඒවා සඳහන් කරන්න. (ලකුණු 4)
    (iii) සෙයිද් බින් සාබිත් (රළි) තුමා ගැන කෙටියෙන් ලියන්න. (ලකුණු 6)

04. (i) කතීජා (රළි) තුමිය, නබි (සල්) තුමා සමග විවාහ වන විට ඇගේ වයස කීය ද? (ලකුණු 2)
    (ii) ආයිෂා (රළි) තුමියට සුවිශේෂ වූ නාමයන් දෙකක් ලියන්න. (ලකුණු 4)
    (iii) නබි (සල්) තුමාගේ ගැහැනු හා පිරිමි දරුවන්ගේ නම් සඳහන් කරන්න. (ලකුණු 6)

05. (i) නබි (සල්) තුමාට කිරි දී හදා වඩා ගත් ගැමි කාන්තාවගේ නම කුමක් ද? (ලකුණු 2)
    (ii) නබි (සල්) තුමාගේ සුවිශේෂී යහ ගුණාංග 2ක් ලියන්න. (ලකුණු 4)
    (iii) හදීස් හෙවත් සුන්නාහ් පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 6)

06. (i) මුලින් ම පහළ වූ සූරාව කුමක් ද? (ලකුණු 2)
    (ii) අල් කුර්ආනයේ ජුස්උ හා මන්සිල් ගණන සඳහන් කරන්න. (ලකුණු 4)
    (iii) අල් කුර්ආනය පාරායනා කිරීමේ දී පිළිපැදිය යුතු කරුණු හයක් ලියන්න. (ලකුණු 6)